# කජු ව්‍යාප්තිය සඳහා සිදුකරන මෙහෙවර

**වියළි දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන, අඩු වර්ෂාපතනයකින් පෝෂණය වන වැලිගල්, බොරළු හා ලෝම් පසේ මෙම බෝගය වගා කළ හැකිය. එමෙන්ම ලෙඩ රෝග අඩුවෙන් වැළඳෙන, කජු පහසුවෙන් වගා කළ හැකි බෝගයක් ලෙස ද දැක්විය හැකිය.**

**වියළි දේශගුණික තත්ත්වයට වඩා ඔරොත්තු දෙතත්, ලංකාවේ භූමියෙන් 75%ක ප්‍රමාණයක කජු වගා කළ හැකි වීම විශේෂ ලක්ෂණයකි. දැනට ලංකාවේ පුත්තලම, අනුරාධපුර, කුරුණෑගල, අම්පාර, මොණරාගල, මඩකලපුව, හම්බන්තොට, පොළොන්නරුව, රත්නපුර, මහියංගනය යන ප්‍රදේශවල කජු වගාව ප්‍රමුඛස්ථානයක් ගනී.**

තවමත් ලෝක වෙළඳපොළේ ඉල්ලුමට සරිලන සැපයුමක් තබා අවශ්‍යතාවෙන් 50%ක් තරම් ලබා ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් වී තිබේ. මෙම තත්ත්වයෙන් පැහැදිලි වන්නේ, කජු වගාව ප්‍රමුඛ බෝගයක් ලෙස සංවිධානය කර වගා කිරීමෙන්, අප රටේ ගොවියන්ගේ ජීවන තත්ත්වය දියුණු වනවා පමණක් නොව ඒ තුළින් ජාතික ආර්ථිකය ද දියුණු මට්ටමකට ගෙන ඒමට යම් දායකත්වයක් ලබාදීමට හැකි බවය.

අප රටේ කජු වගාව, ලාංකීය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ, සංවිධානාත්මකව සිදු කිරීමේ වැදගත්කම හඳුන්වාදීම සිදු වූයේ, 1973 වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවීමෙන් පසුවය. මේ තුළින් විශේෂයෙන් වියළි කලාපයේ ගැමි ජනතාවගේ ආර්ථික මට්ටම දියුණු කිරීමෙන්, ඔවුන්ගේ ජීවන රටාව සමෘද්ධිමත් කිරීම වැදගත් කොට සැලකිය හැකිය.

වියළි දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන, අඩු වර්ෂාපතනයකින් පෝෂණය වන වැලිගල්, බොරළු හා ලෝම් පසේ මෙම බෝගය වගා කළ හැකිය. එමෙන්ම ලෙඩ රෝග අඩුවෙන් වැළඳෙන, කජු පහසුවෙන් වගා කළ හැකි බෝගයක් ලෙස ද දැක්විය හැකිය.

වියළි දේශගුණික තත්ත්වයට වඩා ඔරොත්තු දෙතත්, ලංකාවේ භූමියෙන් 75%ක ප්‍රමාණයක කජු වගා කළ හැකි වීම විශේෂ ලක්ෂණයකි. දැනට ලංකාවේ පුත්තලම, අනුරාධපුර, කුරුණෑගල, අම්පාර, මොණරාගල, මඩකලපුව, හම්බන්තොට, පොළොන්නරුව, රත්නපුර, මහියංගනය යන ප්‍රදේශවල කජු වගාව ප්‍රමුඛස්ථානයක් ගනී.

### කජු වගාව දියුණු කිරීමට හේතු

1. මුලින් දැක්වූ පරිදි දිනෙන් දින වැඩිවන පරිභෝජනය නිසා ලෝක වෙළඳ පොළේ නොමියන ඉල්ලුමක් පවතින භෝගයක් තුළින් විශාල විනිමය ප්‍රමාණයක් ජාතික ආර්ථිකයට එකතු කිරීමට හැකියාවක් ඇතිවීම.
2. ග්‍රාමීය ජනතාවගේ, ස්ථිර ආදායම් මාර්ගයක් ලෙස එළි දැක්වීම තුළින්, ඔවුන්ගේ ජීවිත සමෘද්ධිමත් කිරීමට ඇති හැකියාව.
3. මුඩු බිම් වගා කිරීම නිසා, පරිසරය සංරක්ෂණයට දායක වීමට කජු වගාවට හැකිවීම.

මෙවැනි වැදගත් අරමුණු රාශියක් ඉෂ්ඨ වීම පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීමේදී, ගොවියෙකුට අක්කරයකට රු.14000.00 - රු. 18000.00 අතර වාර්ෂික ආදායමක් ලබා ගත හැක. මෙම මුදල්මය වටිනාකම අනෙක් වැවිලි හා සසඳන විට සුළු වියදමකින් හා සුළු කැප කිරීමකින්, ඉතා හොඳ ආදායම් තත්ත්වයක් ලබා ගැනීමක් ලෙස දැක්විය හැකිය.

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ**
**සම්බන්ධීකරණ නිලධාරී. කේ.එස්. පීරිස්.**

මෙම වගාවට සමාන්තරව, අතුරු බෝග වගා කිරීමට ඇති හැකියාව නිසා, අතිරේක ආදායමක් ගොවියාට ඉපයීමට ඉඩ ප්‍රස්ථාව වැඩි වීමෙන් ඔවුන් නිතැතින්ම සරුසාර ආර්ථිකයකට උරුමකම් කියනු ඇත. කජු වගාව අතර කෙසෙල්, රටකජු, පරිප්පු, තල, කවුපි හා එළවලු වැනි බෝග අතුරු බෝග ලෙස වැවීමෙන්, ගොවියාගේ වාර්ෂික ආදායම රු : 20000/- සිට රු : 30000/- දක්වා වැඩි කර ගත හැකි වීම විශේෂ ලක්ෂණයකි. විශාල පරිමාණයේ වගාකරුවන්ට මීට වඩා විශාල අතිරේක ආදායමක් ලැබෙන බව පරීක්ෂණවලින් හෙළිදරව් වී ඇත.

වර්ෂාව හිඟ, ජලය ඌන ප්‍රදේශවල අඩු වියදමින් වගා කළ හැකි, එමෙන්ම වසර 20-25 ක කාලයක් රඳා පවතින, දීර්ඝ කාලීන බෝගයක් වීම මෙහිලා සඳහන් කිරීම වැදගත්වේ. මෙවැනි වටිනාකමක් ඇති කෘෂිකාර්මික බෝගයක් ලෙස කජු වගාව, දියුණුකර ප්‍රධාන ආර්ථික බෝගයක් ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ස්ථාවර මට්ටමකට ගෙන ඒමේ දී, කජු ව්‍යාප්ත සේවයේ වැදගත්කම ශ්‍රී ලංකා කජු සංස්ථාව හඳුනා ගෙන ඇත. දැනට ශ්‍රී ලංකාවේ කජු ව්‍යාප්තිකරණය සිදු කිරීමේදී, ක්‍රම වේදයන් දෙකක් අනුගමනය කරනු ලැබේ.

1. වතු වගාවන් ලෙස (අක්කර 50 ට වැඩි)
2. කුඩා පරිමානයේ ගෙවතු වගාවන් ලෙස (අක්කර 1/2 - 10 දක්වා)

**කජු වගාව ප්‍රමාණාත්මකව වැඩිකිරීම තුළින්, වැඩි අස්වැන්නක් ලබා ගැනීමත්, ඒ තුළින් වැඩි අදායමක් ලබාගැනීමත් කජු ව්‍යාප්ත සේවාවේ ප්‍රධාන අරමුණ ලෙස දැක්විය හැක. ඉහත සඳහන් ක්‍රම වේදයන් අනුගමනය කිරීමෙන් ලංකා භූමිය තුළ කජු වගා කරන ඉඩම් අක්කර ප්‍රමාණය වැඩි කිරීම සිදු වේ. මේ අනුව වාර්ෂිකව නව වගා බිම් වැඩි කිරීමක් අපේක්ෂා කෙරේ. ඊට අදාළ විධිවිධාන යෙදීම තුළින් අක්කර 1/2 - 10 අතර ගෙවතු වගා ලෙස කජු වගා කර අක්කර 50000/- ඉලක්කයක් සපුරා ගැනීම මෙම කජු ව්‍යාප්ති සේවයේ ප්‍රධාන අපේක්ෂාව වේ.**

පසුගිය දශක දෙක තුළ, ව්‍යාප්ති කරණයේ වැදගත් කම වඩ වඩාත් ඉස්මතුවූයේ කජු පරිභෝජනය වැඩි වීමත්, අපනයන වෙළඳ පොළ පුළුල් වීමත්, හේතු කොට ගෙනය. ශ්‍රී ලංකා කජු සංස්ථාව 1998 වර්ෂය සඳහා ව්‍යාප්ති සේවාව තුළින් , අක්කර 8500ක ඉලක්කයක් සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

දිවයින පුරා කජු වගා කිරීමට ඇති හැකියාව මත මෙතෙක් කිසිවක් වගා කර නැති අක්කර ලක්ෂ 10 ක පමණ ඉඩම් ප්‍රමාණයක් මේ සඳහා යොදා ගත හැකි බව ගණන් බලා ඇත. මේ අනුව ප්‍රථම අදියර තුළ, දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 73ක නව කජු වගා කිරීමට සැලසුම්කර ක්‍රියාත්මක කර ඇත. කජු ව්‍යාප්ති සේවයේදී ප්‍රමුඛස්ථානය දී ඇති දිස්ත්‍රික්කයන් ලෙස, හම්බන්තොට, මොනරාගල බදුල්ල, අම්පාර, මඩකලපුව, මාතලේ, රත්නපුර, පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන් සඳහන් කළ හැකි අතර, ඊට අමතරව, ශ්‍රී ලංකා කජු සංස්ථාව හා උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව, එම දෙපාර්තමේන්තු නිර්ණායකයනට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 32ක අක්කර 775ක ප්‍රමාණයක බද්ධ කජු වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. කජු ව්‍යාප්ති සේවාවේ සාර්ථකත්වය ඇති කිරීමට හා එය ඵලදායී ලෙස මෙහෙයවීම සඳහා ග්‍රාමීය වැවිලිකරුවනට උපදෙස් හා තාක්ෂණික දැනුම ලබාදීම, ඔවුන් උනන්දු කරවීම හා සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව අදාළ සෑම බල ප්‍රදේශයකම කජු සංවර්ධන නිලධාරීන් පත්කොට ඇත. මීට අමතරව, සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන විශාල පරිමාණයේ කජු වතු සඳහා වතු අධිකාරීවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන්, කම්කරු පාලකවරු, මඟින් මෙම ව්‍යාප්ති සේවාව සාර්ථක කරලීම සඳහා ආදර්ශන ගොවිපළ ක්‍රමයක් ලෙස එකී වතු පරිවර්තනය කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 73ක කජු වගා ආදර්ශන 73ක් ඇති කර එමඟින් කජු වගාව පිළිබඳ කළමනාකරණ නිපුනතාවක් ගොවීන්ට ලබාදීමට කටයුතු කර ඇත.

මෙම නිලධාරීන් අධීක්ෂණය සඳහා, ප්‍රාදේශීය කළමනාකරුවන්, කලාප හා දිස්ත්‍රික් මට්ටමින් පත්කර ඇත. ප්‍රධාන මෙහෙයුම් කටයුතු හා ඇගයීම් මූලස්ථාන ව්‍යාප්ති කළමනාකරුවන් මඟින් සිදුවේ. මෙවැනි සංවිධාන ව්‍යුහයක් තුළ ක්‍රමවත් සැළසුමක් යටතේ ක්‍රියාත්මකවීම දක්නට ලැබේ. මෙම නිලධාරීන් සියලු දෙනාම තම සේවාවන් ඉටු කිරීම සඳහා පහත සඳහන් අංශ මඟින් ව්‍යාප්ති සේවාවේ ඵලදායිතාව වැඩි කිරීමට උත්සුකව ඇත.

1. අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
2. පර්යේෂණ පුහුණු, හා නව හඳුන්වාදීම් ඉදිරිපත් කිරීම.
3. සහනාධාර වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.
4. ගොවීන් සංවිධානය කිරීම.
5. අලෙවිකරණය හා කුඩා පරිමාණයේ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා සංවිධානය කිරීම

### 01. අධ්‍යාපනික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

වාර්ෂිකව, මෙම වැඩ සටහන් තුළින් ක්ෂේත්‍රයේ

නියැලි සිටින, ගොවීන්, නිලධාරීන්, පරිපාලකවරුන්, හා බහුවිධ සංවිධාන දැනුවත් කිරීම, උපදෙස්දීම, සිදුකෙරේ. මෙහිදී තාක්‍ෂණික දැනුම, ශිල්පීය ඥානය, වැඩි දියුණු කිරීම සඳහා පොත් පත්, පත්‍රිකා නිකුත් කිරීම, පුහුණු වැඩ සටහන් වැඩ මුළු පැවැත්වීම විශෙෂ වේ.

## 02. පර්යේෂණ පුහුණු, හා නව හඳුන්වාදීම් ඉදිරිපත් කිරීම

**ව්‍යාප්ති සේවාවේ පුළුල් වර්ධනයක් ලබා ගැනීම සඳහා, ඵලදායිතාවයෙන් වැඩි නව භෝග හඳුන්වාදීම, නවාන් ක්‍රම පිළිබඳ හඳුන්වාදීම මෙම තත්ත්වයන් පිළිබඳව පුහුණු වැඩ මුළු පැවැත්වීම, පොහොර භාවිතය පිළිබඳව දැනුවත් කිරීම, ලෙඩ රෝග හඳුනාගැනීම, හා මර්ධනය කිරීමේ වැඩ පිළිවෙලවල් හඳුන්වාදීම, මඟින් ව්‍යාප්ති සේවාව සාර්ථක කරලීම සිදුවේ. තවද පර්යේෂණ හා පුහුණු අංශය තුළින්, දැනටමත් අක්කරයට වැඩි පැල ගණනක් සිටුවිය හැකි බද්ධ කජු පැල විශෙෂයක් හඳුන්වා දෙමින් සිටී. මීට අමතරව වසරකට දෙවරක් ඵල දරන කජු විශෙෂයක් හඳුන්වා දීමට උත්සුකව සිටී.**

මෙම පර්යේෂණ අංශය තුළින්, ගොවීන් හා ව්‍යාපෘති සඳහා සහතික කළ බීජ ලබා දීම සිදුකෙරේ. මෙම තෝරා ගැනීම්වලදී දීර්ඝ කාලීන වගාවක් ලෙස පවතින කජු ගසින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හා ලෙඩ රෝගවලට ඔරොත්තුදීමේ හැකියාව ඇති කජු තෝරා ගැනීම වැදගත්වේ. එබැවින් සංස්ථාව විසින් විශෙෂයෙන් තෝරාගත් මව් ගස්වලින් ලබා ගන්නා සහතික කළ බීජ ව්‍යාප්ති සේවාවේ හා අනෙකුත් වගාකරුවන් අතර බෙදාදීම සිදු කෙරේ.

## 03. සහනාධාර ක්‍රම

කජු වගාකරුවන් සඳහා සහනාධාර, මුදල් ලෙස 1996 වර්ෂය දක්වා ගෙවනු ලැබුවේ අක්කරයකට රු.600/- ක මුදලකි. කජු ව්‍යාප්තකරණයට නව පනක් ලබාදීමේ අරමුණින් 1997 වර්ෂයේ සිට අක්කරයකට රු.3500/-ක සහනාධාර මුදලක් කජු සංස්ථාව විසින් ලබාදෙනු ලැබේ. මීට අමතරව, කෘෂි රසායනික ද්‍රව්‍ය හා තාක්‍ෂණික උපදෙස් ලබාදීම මෙම සහනාධාර වැඩ පිළිවෙලේ එක් කොටසක් ලෙස දැක්විය හැකිය.

## 04 ගොවි සංවිධාන පිහිටුවීම

කජු වගා ක්ෂේත්‍රයේ, නියලී සිටින ගොවීන් සංවිධානය කිරීම තුළින් ඔවුන්ගේ ශක්තිය හා දැනුම පුළුල් කිරීමත්, සංවිධානයක් ලෙස ඒකරාශි කිරීම තුළින්, වගාව සාර්ථකව පවත්වාගෙන යෑමට ඇති අවකාශ වැඩි කිරීමටත්, ඔවුන්ගේ ආර්ථික ගැටළුවලට සංවිධානාත්මකව මුහුණදීම තුළින් එම ගැටළු අවම කරගැනීමටත් මෙම ගොවි සංවිධාන පිටුවහලක් වේ. මෙම ගොවි සංවිධාන අදාළ බල ප්‍රදේශ තුළ කජු ගොවීන් 25-50 දෙනෙකුගේ දායකත්වයෙන් සිදු කිරීමට කටයුතු යොදා ඇත. ගොවීන් මෙලෙස සංවිධානය කිරීම තුළින්, නිලධාරින් හා උපදේශකයින් අතර, නිරන්තර සම්බන්ධතාවක් ඇතිවීම නිසා සාර්ථකවූ කජු වගා ක්ෂේත්‍රයක් ඇතිවීම මෙහි විශෙෂත්වය වේ.

## 05. අලෙවිකරණය හා කුඩා පරිමාණයේ ව්‍යවසායකයින් සංවිධානය කිරීම

කජු ව්‍යාප්ත සේවාව තුළ වැඩිවන අස්වැන්න අලෙවි කර ගැනීමටත්, ඒ සඳහා යහපත් මිලක් ලබා ගැනීමටත් මේ ක්‍රියාවලි තුළින් ගොවීන්ට හැකිවනු ඇත. කජු වගාකරුවන්ගේ ඵලදාව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිරි සැකැසුම් මධ්‍යස්ථාන විසින් හා කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන් විසින් මිලදී ගැනීම සිදු කෙරේ. අද ගොවීන්ට, ලැබෙන මුදල කිලෝග්‍රෑමයකට රු.45/- දක්වා වැඩිවන අවස්ථාද දක්නට ඇත.

සුලු පරිමාණයේ කජු පිරිසැකසුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් කුඩා පරිමාණයේ, අඩු මිලකින් යුක්ත උදුන් විශෙෂයක් සහනදායි මිල ක්‍රමයකට ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇත. ඔවුන්ගේ කජු නිෂ්පාදන ශ්‍රී ලංකා කජු සංස්ථාව මිලදී ගැනීමටද කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාවේ කජු වගාවේ ව්‍යාප්ති වර්ධනය සඳහා මෙලෙස නොයෙක් ක්‍රම වේදයන් දැනට අනුගමනය කරනු ලබන අතර මේ තුළින් රටේ කජු වගාකරුවන්ගේ මෙන්ම ව්‍යවසායකයින්ගේද විශෙෂ උනන්දුවක් හා ඕනෑකමක් ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. මෙයට නිදසුනක් ලෙස උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්ථමේන්තුවේ දායකත්වයෙන් උඩරට කජු වගාකළ හැකි ප්‍රදේශවල කජු වැවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම හා මහවැලි ප්‍රදේශවල කජු වැවීම ආරම්භ කිරීම පෙන්නුම් කළ හැක.

මෙය මෙසේ වුවද, කජු වගාවේ ශීඝ්‍ර දියුණුවට දැඩි නියඟය පවතින අවස්ථාවල මහත් අහිතකර බලපෑම් ඇතිවී තිබෙන බවද, සඳහන් කළ යුතුව ඇත. මෙම තත්ත්වය කජු වගාවට මෙන්ම ඵලදාවටද බලපා ඇත. එමෙන්ම රට තුළ අද පවතින යුද්ධමය වතාවරණය මත වගා කරනු ලැබූ විශාල අස්වැන්නක් ලැබූ, මන්නාරම, කොනඩවිල්, සිලාවතුර, මඩු වැනි ප්‍රදේශවල අක්කර 13000ක පමණ වගාවක් සංවර්ධනය කිරීමට නොහැකිව විනාශ වෙමින් පවතී.

මෙවැනි තත්ත්වයක් කජු වගාව කෙරෙහි බලපෑවද, සමස්ථයක් ලෙස කජු වගාව කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ හා ජන සමාජය තුළ යම් පිබිදීමකට, පරිවර්තනයකට පත්වෙමින් පවතින බව සනාථව ඇත.